සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**9 ශ්‍රේණිය** වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 **50 S I**

**නාට්‍ය හා රංග කලාව** **කාලය පැය දෙකයි**

නම / අංකය : ........................................................................................................................

**සැලකිය යුතුයි :- ● I කොටසෙහි සියලු ම ප්‍රශ්න වලට මෙම පත්‍රයෙහි ම පිළිතුරු සපයන්න.**
**● නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

I කොටස

● **පහත දැක්වෙන සංවාද ඇසුරෙන් අංක 01 සිට 04 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A: විචිත්‍ර වර්ණෝපශෝභිත වූ මෙම මණ්ඩප ද්වාරයෙහි මිනිස්සු ඇත.

B: මේ එන්නම උවමනාවක් නිසා තමයි මම ආවේ. ඔබ ඉඩ දෙනවා නම් මම කැමතියි මෙහේ නවාතැන් ගන්න අද රාත්‍රියට

C: එසේ වී නම් නියපොතු, දත්, සම්, මස්, නහර ආදිය නාගසේන ද?

D: නෙක බල පරාක්‍රම ප්‍රතාපාලංකෘත වූ සුරේන්‍ද්‍රාරාධනාවට ගියා වූ දේව දූතයා වන මම මෙහි අවුත් සිටිමි.

E: ඔබ වහන්සේ මෙම ස්ථානය ගැන දන්නේ නැද්ද ............................................ මගේ තැනක් නම් ඔබ වහන්සේට නවාතැන් දෙන එකත් අරුමයක්ද?

F: මහරජ කිමෙක් ද තෙපි පයින් ම ආයේ ද?

01. ඉහත සංවාද ඛණ්ඩ අතරින් මිලින්ද ප්‍රශ්නය සඳහා අදාළ සංවාද අයත් වනුයේ,

1. A, C  2. B, E  3. C, F  4. D, F

02. A හා E සංවාද ඛණ්ඩය අයත් බෞද්ධ පූජා කර්ම දෙක වන්නේ,

1. මිලින්ද ප්‍රශ්නය හා දොරකඩ අස්නය
2. දොරකඩ අස්න හා ආලවක දමනය
3. ආලවක දමනය හා යුගාසන බණ
4. යුගාසන බණ හා මිලින්ද ප්‍රශ්නය

● **අංක 03 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සපයන්න.**

03. වඩාත් නිවැරදි ලෙස සැලකීමේ දී කදා වළලු නාට්‍ය අයත් ශෛලිය වන්නේ,

1. ලෝකධර්මී ශෛලිය
2. නාට්‍යධර්මී ශෛලිය
3. මිශ්‍ර ශෛලිය
4. මේ කිසිවක් නොවේ.

04. චරිතයක අභ්‍යන්තරයේ දැකිය හැකි විවිධ පැතිකඩ හැඳින්වෙන්නේ,

1. අභ්‍යන්තර චරිත නමිනි.
2. සමාරෝපය නමිනි
3. ආනුශංගික කලා නමිනි.
4. භූමිකා නමිනි.

05. නාට්‍ය පිටපතක වරහන් තුළ සඳහන් වන පද හඳුන්වන්නේ,

1. විධි ක්‍රියා ලෙස ය.
2. රංග විධාන ලෙස ය.
3. සංවාද ලෙස ය.
4. ගීත ලෙස ය.

- **පහත අංක 06 සිට 08 දක්වා ප්‍රශ්නවලට නොගැළපෙන පිළිතුර තෝරන්න.**

06. සමාරෝපය යන්න මෙසේ ද හැඳින්විය හැකි ය.

1. වෙස්වලා ගැනීම  2. ආරූඪ වීම.  3. මෝහනය වීම  4. ආවේෂ වීම.

07. කටහඬ අභ්‍යාස ප්‍රගුණ කිරීම සඳහා ඔබ පංති කාමරයේ භාවිත කළ ග්‍රන්ථ වන්නේ,

1. සකස්කඩ  2. මහාවංශය  3. බුද්ධ ගජ්ජය  4. නම්පොත

08. වාද්‍ය බණ්ඩයකට ප්‍රකාශනාත්මක නිරූපණයක් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු වන්නේ,

1. වාදන යන්ත්‍රයේ ස්වභාවය  2. අර්ථාන්විත බව

3. ආරම්භය හා නිමාව  4. තාලය හා රිද්මය

- **හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.**

( පරිකල්පනය / අභිරූපණය / ගැටුම / ක්ෂණික නිරූපණය )

09. පෙර සූදානමකින් තොරව ඉදිරිපත් කරන්නේ .................................................................. යි.

10. සිතින් රූප නිර්මාණය කිරීමේ හැකියාව ............................................................................ ලෙස හැඳින්වේ.

11. චරිත අතර ප්‍රතිවිරෝධී අදහස් මතුවීමෙන් ........................................................ ඇති වේ.

- **පහත ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති හිස්තැන තුළ යොදන්න.**

12. වේදිකා උපකරණ, වේදිකා පසුතල නිර්මාණ ආදිය නොමැතිව වුවද
නාට්‍යයක් සාර්ථකව ඉදිරිපත් කළ හැකිය. ( ..................)

13. සැබෑ ජීවිතයේ දි භාවිත කරන උපකරණ, වේදිකා නාට්‍ය සඳහා ද එලෙස ම භාවිත කළ හැකිය. ( ..................)

14. පසුතල නිර්මාණයේ දී නාට්‍ය ඉදිරිපත් කරන රංග ශෛලිය පිළිබඳ සැළකීම අත්‍යවශ්‍ය නොවේ. ( ..................)

15. නළුවාගේ බාහිර සමාරෝපයට මෙන් ම අභ්‍යන්තර සමාරෝපයට ද වේෂ භූෂණ වැදගත් වෙයි. ( ..................)

- **16 සිට 18 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.**

16. ඔබ එකිනෙකාට මුහුණ ලා අක්ෂි සම්බන්ධතාවය පවත්වාගෙන යමින් සිදුකළ අභ්‍යාසය හඳුන්වන්නේ,

1. ඇස පිළිබඳ සංවේදන අභ්‍යාස ලෙසය.  2. දර්පණ තල අභ්‍යාසය ලෙස ය.

3. පරිකල්පන අභ්‍යාස ලෙස ය.  4. ශිථිලකරණ අභ්‍යාස ලෙස ය.

17. " බඳ පටියේ මැණික දිලේ - එහි රැස් බිඳු බිමට හැලේ
රජ කෙනෙකුගෙ හැඩ පවසයි - රැඳුනු වචන ඔබගෙ තොලේ"

ඉහත ගායනය ඔබ ඉදිරිපත් කරන ලද්දේ,

1. ගීතයක තාලයට ය.  2. විරිඳු තාලයට ය.  3. සේ ගී තාලයට ය.  4. ටීකා තාලයටය

18



ඉහත රූප සටහන ආශ්‍රයයෙන් ඔබ සිදු කරන ලද රංග අභ්‍යාසය වන්නේ,

1. ශිථිලකරණ අභ්‍යාස 2. තාපන අභ්‍යාස 3. සංවේදන අභ්‍යාස 4. දර්පනතල අභ්‍යාස

- **පහත තොරතුරු ඇසුරෙන් 19 හා 20 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

ස - මුදුපුත්තු නාට්‍යයේ සරා ගේ චරිතය මුලින් ම නිරූපණය කරන ලදි.

රි - ආරම්භයේ සිට වසර ගණනාවක් මනමේ නාට්‍යයේ වැදි රජුගේ චරිතය මොහු විසින් නිරූපණය කරන ලදි.

ග - මනමේ නාට්‍යයේ මනමේ කුමරියගේ චරිතය නිරූපණය කරන ලදි.

ම - සිංහබාහු නාට්‍යයේ ආරම්භක අවධියේ සිංහයාගේ චරිතය මොහු නිරූපණය කරන ලදි.

19. 'ස' හි චරිතය නිරූපණය කරන් ලද්දේ,

1. ට්‍රිලීෂියා ගුණවර්ධන විසිනි. 2. මාලනී රණසිංහ විසිනි.

3. සෝමලතා සුභසිංහ විසිනි. 4. කුසුම්රේණු විසිනි.

20. 'රි' සහ 'ග' හි සඳහන් රංගන ශිල්පීන් දෙපළ වන්නේ,

1. මාර්ක් ඇන්ටනී ප්‍රනාන්දු හා යශෝධරා සරච්චන්ද්‍ර විසිනි.

2. සාලමන් ෆොන්සේකා හා මැණිකේ අත්තනායක විසිනි.

3. නිශ්ශංක දිද්දෙණිය හා මාලනී රණසිංහ විසිනි.

4. එඩ්මන් විජේසිංහ හා ට්‍රිලීෂියා ගුණවර්ධන විසිනි.

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 9 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 50 S II |
|---|---|---|

**නාට්‍ය හා රංග කලාව** — කාලය පැය දෙකයි

නම / අංකය : ..........................................................................................................

**සැලකිය යුතුයි :-** ● පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.


## II කොටස

කදා වළලු නාට්‍ය පෙළ ඇසුරු කරගෙන පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(01) i. කදා වළලු නාට්‍යයේ චරිත නම් කරන්න. (ල. 02)
ii. කදා වළලු නාට්‍යය මුලින් ම වේදිකාගත කළ වර්ෂය හා ස්ථානය කුමක් ද? (ල. 02)
iii. කදා වළලු නාට්‍යයට පසුබිම් වූ ජාතක කථාව සහ නාට්‍යයේ දැක්වෙන කථාව අතර දක්නට ලැබෙන සමානකමක් ලියන්න. (ල. 02)
iv. කදා වළලු නාට්‍යයෙන් ඉස්මතු වන ප්‍රබලම තේමාව කුමක් ද? (ල. 02)
v. මෙම නාට්‍යයේ දක්නට ලැබෙන නාට්‍යෝපකරණ තුනක් ලියන්න. (ල. 02)

(02) i. නාට්‍ය පෙළ යනු කුමක් ද? (ල. 02)
ii. ඔබ විසින් අධ්‍යයනය කර ඇති පහත සඳහන් නාට්‍ය දෙකෙහි තේමා කෙටියෙන් ලියන්න. (ල. 03)
1. කදා වළලු 2. මාෂා සහ වළහා
iii. ඔබට නාට්‍යය පිටපතක් ලිවීමට ලැබී ඇත්නම් ඔබ අනුගමනය කරන ක්‍රියා මාර්ග පැහැදිලි කරන්න. (ල. 05)

(03) i. රංග ක්‍රීඩා යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල. 02)
ii. ඔබ උගත් රංග ක්‍රීඩා 03 ක් නම් කරන්න. (ල. 03)
iii. පංති කාමරයේ දී සිදුකරන ලද රංග ක්‍රීඩාවක් ඇසුරින් ඔබ ලැබූ අත්දැකීම් හා කුසලතා පැහැදිලි කරන්න. (ල. 05)



(04) i. රූපයේ දැක්වෙන නාට්‍යකරුවා නම් කරන්න. (ල. 02)
ii. ඔහු විසින් නිෂ්පාදනය කරන ලද නාට්‍ය තුනක් ලියන්න. (ල. 03)
iii. සිංහල නාට්‍ය ක්ෂේත්‍රයට ඔහුගෙන් සිදු වූ සේවය පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(05) i. අභිනය' යනු කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)
ii. සාත්වික අභිනය' යන්න කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)
iii. ඔබ නරඹන ලද නාට්‍යයක සතර අභිනය භාවිතා කර ඇති ආකාරය පැහැදිලි කරන්න. (ල. 05)

# තෙවන වාර පරීක්ෂණය - 2019

## නාට්‍ය හා රංග කලාව

09 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය
## I කොටස

| | |
|---|---|
| 01 - 3 | 11 - ගැටුම |
| 02 - 2 | 12 - ✓ |
| 03 - 3 | 13 - ✗ |
| 04 - 4 | 14 - ✗ |
| 05 - 2 | 15 - ✓ |
| 06 - 3 | 16 - 2 |
| 07 - 2 | 17 - 2 |
| 08 - 1 | 18 - 1 |
| 09 - ක්ෂණික නිරූපණ | 19 - 3 |
| 10 - පරිකල්පන | 20 - 4 |

ගුරුභවතුන් සඳහා පමණි

# නාට්‍ය හා රංග කලාව
# ප්‍රයෝගික පරීක්ෂණය - 2019
# 9 ශ්‍රේණිය

- සියලුම ප්‍රායෝගික පරීක්ෂණ සඳහා සිසුන් ඉදිරිපත් විය යුතුය.
- කාලය උචිත පරිදි යොදා ගන්න.

1. ඔබ කැමති නාඩගම්/ නූර්ති/ නූතන නාට්‍ය ගීතයක් ඊට අදාළ රූපණය සමග ඉදිරිපත් කරන්න.
   ( ගායනය හා රංගනය ඇත්නම් නියමිත ලකුණු ලබා දෙන්න).
   - සම්පූර්ණ ගීතය ගායනය කළ යුතුය.
   - අංගචලන හා භාව ප්‍රකාශන සහිත විය යුතුය.
   - නියමිත නාද මාලාවට අනුව ගායනය කළ යුතුය. ( ලකුණු 10 )

2. සංවාද ඛණ්ඩයක් ඉදිරිපත් කිරීම.

   " කදා වළලු " නාට්‍යයේ සංවාද කොටසක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම. ( ලකුණු 10 )

3. එසැණ නිරූපණය
   පහත සඳහන් මාතෘකා අතරින් ශිෂ්‍යයා තෝරාගන්නා ලද මාතෘකාවකට අනුව එසැණ නිරූපණයක් ඉදිරිපත් කළ යුතුය.

   (1) ශාන්තිකර්මයක් අතරතුරේදී.........
   (2) වසර දහයකට පසු විදේශගත වී සිටි තම සොහොයුරිය නිවසට පැමිණීම......
   (3) පන්සලේ සිල් සමාදන් වී සිටින විට.............
   (4) නිවසින් නිවසට යන ජන්ද අපේක්ෂිකාවක්.........
   (5) පංතිකාමරයේ ඉගෙන ගනිමින් සිටින විට අසල පංතියෙන් විශාල ශබ්දයක් ඇසීම......

4. කතා පුවතක් නාට්‍යානුසාරිව ඉදිරිපත් කිරීම.

   සිසුවා විසින් තෝරාගත් දෙස් විදෙස් ජනකථා/ සුරංගනා කතා/ උපමා කතා හෝ වෙනත් සුදුසු කතාවක් නාට්‍යානුසාරිව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
   ( ලකුණු 10 )

5. කෙටි නාට්‍ය නිෂ්පාදනය - සාමූහික

   සිසුන් විසින් පෙර සූදානමකින් පැමිණි නාට්‍ය ඉදිරිපත් කිරීම. ( අනුශාංගික අංග ඇතුළත් විය යුතුය )
   ( ලකුණු 10 )